**කළමනාකරණ පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
**முகாமைத்துவ பீடம், பேராதனைப் பல்கலைக்கழகம், இலங்கை**
**Faculty of Management, University of Peradeniya, Sri Lanka**
**කළමනාකරණ හා සංවර්ධන ඩිප්ලෝමාව**

# DM – 015 මානව සම්පත් කළමනාකරණය

***උපදෙස්:***
ඕනෑම ප්‍රශ්න **හතරකට (04)** පිළිතුරු සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සමන්විත වේ. **(මුළු ලකුණු 60)**

***දිනය:*** ***කාලය : පැය තුනයි***

**ප්‍රශ්න අංක 01**

I. මානව සම්පත් කළමනාකරණය නිර්වචනය කරන්න. (ලකුණු 02)

II. මානව සම්පත් කළමනාකරණය සියලුම කළමනාකරුවන්ට වැදගත් වන්නේ ඇයි ? පැහැදිලි කරන්න. (ලකුණු 04)

III. ආකර්ෂණය, තෝරාගැනීම, පුහුණුව හා සංවර්ධනය සහ වේතන කළමනාකරණය යන මානව සම්පත් කළමනාකරණ කටයුතු ඉටු කිරීමේදී රැකියා විශ්ලේෂණයේ භූමිකාව කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 04)

IV. සේවක අතිරික්තයක් පාලනය කිරීම සඳහා සංවිධානයකට ගත හැකි උපාය මාර්ගයන් පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

**(මුළු ලකුණු 15)**

**ප්‍රශ්න අංක 02**

I. අභ්‍යන්තර ආකර්ෂණ ක්‍රමයේ වාසි සහ අවාසි පැහැදිලි කරන්න. (ලකුණු 05)

II. තෝරා ගැනීමේ ක්‍රමයක් වශයෙන් රැකියා සම්මුඛ පරීක්ෂණවල වාසි සහ අවාසි මොනවාද? (ලකුණු 04)

III. කාර්යඵල කළමනාකරණය සහ කාර්යඵල ඇගයීම වෙන්කොට දක්වන්න. (ලකුණු 02)

IV. කාර්යඵල ඇගයීමේදී ඇතිවිය හැකි ඇගයීමේ දෝෂයන් සාකච්ඡා කරන්න. (ලකුණු 04)

**(මුළු ලකුණු 15)**

**ප්‍රශ්න අංක 03**

I. මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ මානව සම්පත් විධායකයින් සඳහා පුහුණු අවශ්‍යතා ඇගයීමක් (Traning Needs Analysis) සිදු කිරීමට මානව සම්පත් කළමනාකරු විසින් ඔබ වෙත පවරා ඇතැයි උපකල්පනය කරන්න. කණිෂ්ඨ මානව සම්පත් විධායකයන් සඳහා පුහුණු අවශ්‍යතා ඇගයීම ඔබ සිදු කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

II. ඉගෙනුම් මූලධර්ම හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

III. සංවිධාන ආතතිය සඳහා හේතු හඳුනාගෙන, සංවිධාන ආතතිය අඩු කිරීම සඳහා ආයතනයකට ගත හැකි උපාය මාර්ගයන් හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 04)

IV. පාරම්පරික වෘත්තීය කළමනාකරණ (Traditional Career Management) පියවරයන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

**(මුළු ලකුණු 15)**

**ප්‍රශ්න අංක 04**

I. වේතන කළමනාකරණයේ අභ්‍යන්තර සාධාරණත්වය සහ බාහිර සාධාරණත්වය වෙන්කොට දක්වන්න. (ලකුණු 03)

II. "සාමාන්‍යයෙන් ගෙවීම් කළමනාකරණ ක්‍රියාවලිය සංකීර්ණ සංසිද්ධියකි." ගෙවීම් කළමනාකරණ ක්‍රියාවලියේ අදියරයන් හඳුනාගෙන කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

III. විධිමත් දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියාපටිපාටිය හැර දුක්ගැනවිලි විසඳීම සඳහා ආයතනයකට යොදා ගත හැකි වෙනත් ක්‍රම හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

IV. ශ්‍රමික සම්බන්ධතා යන්න නිර්වචනය කොට එය සේවක සම්බන්ධතා වලින් වෙනස් වන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 03)

**(මුළු ලකුණු 15)**

**ප්‍රශ්න අංක 05**

පහත දැක්වෙන ඕනෑම **පහක් (05)** සඳහා විස්තරාත්මක සටහන් ලියන්න.

I. අංශක 360 කාර්යඵල ඇගයීමේ ක්‍රමය

II. රැකියා විස්තරය සහ රැකියා පිරිවිතරය

III. මානව සම්පත් සැලසුම්කරණයේ ඉල්ලුම් පුරෝකතන ශිල්පක්‍රම

IV. වෘත්තීය අනතුරු සහ වෘත්තීය රෝග

V. 21 වන සියවසේ වෘත්තිය කළමනාකරණ ආකෘතිය

VI. වළක්වාලීමේ විනය සහ නිරවද්‍ය විනය

**(5*3 ලකුණු = ලකුණු 15)**

***********************************************